මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2025/09**

**2025.03.11**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025
## බලයලත් නියෝජිතයන් පත් කිරීම.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 89 වන වගන්තිය අනුව බලයලත් නියෝජිතයන් පත්කිරීම නාමයෝජනා කිරීමේ කාලසීමාව ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය හැත්තෑ දෙකකට පෙර සිදු කළ යුතු ය. එබැවින් 2025.03.03 දින නාමයෝජනා දැන්වීම පළ කළ පළාත් පාලන ආයතන 336 සඳහා පිළිගත් දේශපාලන පක්ෂ බලයලත් නියෝජිතයන් පත් කිරීමේ ලිපි 2025.03.14 දින පෙ.ව. 8.30 ට ප්‍රථමයෙන් ඒ ඒ පළාත් පාලන ආයතනයේ තේරීම්භාර නිලධාරී (දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්) වෙත ලබා දිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ස්වාධීන කණ්ඩායම් සම්බන්ධයෙන් වන විට අදාළ කණ්ඩායම් නායකයා විසින් ඇප මුදල් තැන්පත් කරන අවස්ථාවේ දී අපේක්ෂකයන් අතුරින් යම් තැනැත්තකු එම කණ්ඩායමේ බලයලත් නියෝජිතයා ලෙස පත් කළ හැකිය.

2025 මාර්තු මස 13 වන බ්‍රහස්පතින්දා දින (පෝය) රජයේ නිවාඩු දිනයක් වුව ද මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විවෘතව තබා ඇති බව දන්වා සිටිමි.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)